# පෙරදිග අධ්‍යාපනය සහ පුරාතන භාරතීය විශ්වවිද්‍යාල.

**කථිකාචාර්ය පොල්පිටියේ සද්ධාණරංසි හිමි.**

පෙරදිග අධ්‍යාපනය පිළිබඳව විමර්ශනය කිරීමේදී එහි පැවති අධ්‍යාපන මූල ධර්ම ප්‍රධාන වශයෙන් කොටස් කීපයකට උපනිෂද් මුණිවරු බෙද දක්වති.

1. පුද්ගලයා තුළ පවත්නා කෙලෙස් බැම්වලට හේතු සාධක වූ අවිද්‍යාව දුරු කිරීම.
2. පුද්ගලයා තුළ ක්ෂාන්තිය හා සහනය පුරුදු කිරීම.
3. පුද්ගලයා තුළ නිෂ්කාම භක්තිය ඇති කිරීම[1] යනුවෙනි.

උපනිෂද් දර්ශනික සමයෙහි ආරම්භ වූ මෙම අධ්‍යාපන මූලධර්ම භාරතයේ වරින්වර ඇති වූ ආගමික සංස්කෘතික, දර්ශනික, දේශපාලනික විපර්‍යාසයන්ට අනුව වෙනස් විය. මෙහි පැවති උසස් අධ්‍යාපන මූලධර්ම කෙතරම් දුරට ප්‍රායෝගිකව ක්‍රියාත්මක වූවාද යන්න අවබෝධ කර ගැනීමට එහි පැවති උසස් අධ්‍යාපන ආයතන කීපයක හෝ ස්වභාවය අධ්‍යයනය කළ යුතුය.

පුරාතන භාරතීය උසස් අධ්‍යාපන ආයතන අතුරෙන් තක්ෂලා, බාරාණසී, නාලන්ද, වික්‍රමසිලා, වලභි, ජගද්දලා, ඕදන්තපුරි, මිථිලා, නදියා, යන ආයතන ඉතා ප්‍රකට ය. මේවායෙහි අධ්‍යාපන ක්‍රියාවලිය නූතන ලෝකයේ පිළිගත් විශ්වවිද්‍යාලයන්හි පවතින අධ්‍යාපන ක්‍රමයට බෙහෙවින් සමාන විය. අදටත් වඩා ඉදිරියට එම ආයතන ගමන් කොට ඇති බව පෙනෙන්නේ ඒ තුළ ශිෂ්‍යයාගේ අධ්‍යාත්මික පෝෂණය පිළිබඳව



ද සැළකිල්ලක් දක්වා ඇති බැවිනි. එක් එක් විශ්වවිද්‍යාලයන් පිළිබඳව විමර්ශනයක යෙදීමේදී මේ පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම අපහසු නොවෙයි.

## තක්ෂලා විශ්වවිද්‍යාලය

භාරතීය උසස් අධ්‍යාපනයට කේන්ද්‍රස්ථානයක් වූ ගන්ධාර ප්‍රදේශයෙහි තක්ෂලාව පිහිටා ඇත. එහි අධිපතිවරයා "**දිසාපාමොක්**" නමින් හඳුන්වනු ලැබී ය. මෙම විශ්වවිද්‍යාලය පැවතියේ කවර කළකද යන්න නිශ්චිත ලෙස දක්වීමට තරම් සාක්ෂි නොමැති නමුත් එය ක්‍රි.පූ. 6 සියවස මැද භාගයේදී විශ්ව කීර්තියට පත්වන්නට ඇතැයි අනුමාන කළ හැකියි. තිබ්බතය, මොන්ගෝලියාව, චීනය ග්‍රීසිය, වැනි රටවල් සමඟ විදේශ සබඳතා පැවති නිසා විදේශීය බුද්ධිමතුන්ගේ සහාය හා නව දැනුම එයට ලැබෙන්නට ඇත.[2]

නූතන විශ්වවිද්‍යාල මෙන් විවිධ පීඨවලින් සැදුම්ලත් තක්ෂලාවේ එක් විද්‍යා පීඨයක විද්‍යාර්ථීහු පන්සියයකට ශිල්ප හැදෑරීමට පහසුකම් තිබුණි.[3] භාරතයේ බාරාණසී, මගධ, කෝසල, විශාලා, රජගහ, උදේනි, කුරු, රාජ්‍යවලින් පැමිණි රාජ කුමාරවරු සියයක් පමණ වූ පිරිසක් ඉගෙනීම ලද බව සඳහන් වේ.[4] කිසියම් විද්‍යාපීඨයක අධ්‍යයන කටයුතු ඇරඹීමට ප්‍රථමයෙන් දහසින් බැඳි පියළි ශිෂ්‍යයන් විසින් ගුරු දක්ෂිණා ලෙස පිරිනැමිය යුතු විය.[5] ඊට අමතරව ගුරු පඬුරු පිරිනැමීමේ පොරොන්දුව මත අධ්‍යයන කටයුතුවල නිරත ශිෂ්‍යයෝද සිටියහ.[6] දැඩි කුලවාදී පදනමක් පැවති භාරතීය ජනසමාජයේ අධ්‍යාපනය ලැබීමේ දී ද එය බලපාන ලදී. එය කොතරම් ද කිවහොත් පහත්යැයි සම්මත කුලවල ශිෂ්‍යයින්ට අධ්‍යාපනික ඉඩ ප්‍රස්තා නොවූයෙන් ඔවුහු වෙස් වලාගෙන පැමිණ උසස් අධ්‍යාපනයෙහි නිරත වූ වග සඳහන් වේ.[7] ශිෂ්‍යත්ව මගින් අධ්‍යාපනය ලද මෙන්ම එසේ නොලද ශිෂයෝද මෙහි අධ්‍යයන කටයුතු කළ අතර නේවාසික සහ බාහිර ශිෂ්‍යයෝද වූහ.[8] බරණැස් රජු එක් ශිෂ්‍යයෙකු ධනු ශිල්පයෙහි ප්‍රවීණයෙකු කිරීම සඳහා තක්ෂලාවට යවන ලද බව කියවේ.[9] දෙමාපියන් විසින් සිය දරුවන් යවන

ලද්දේ ඉගෙනීම ආරම්භ කිරීමට වඩා ඉගෙනීම අවසන් කිරීමට ය. සොළොස් විය පැමිණි ශිෂ්‍යයින් වැඩි වශයෙන් මෙහි දැකිය හැකි විය.[10] එයින් පැහැදිලි වන වැදගත් සත්‍යයක් තිබේ. එනම් අද මෙන් වයස මුහුකුරා යාමට ප්‍රථමයෙන් දරුවන් උසස් අධ්‍යාපනය නිම කරන ලද බවයි. දක්ෂ ලෙස අධ්‍යාපනය ලත් ශිෂ්‍යයෝ ආචාර්‍ය්‍ය පදවි වලින් පවා පිදුම් ළදහ.[11] විෂය දැනුම ලබාදීමට සමගාමීව පුද්ගල චරිත වර්ධනය කෙරෙහි ද විශේෂ පාඨමාලා තිබූ බව සඳහන් වේ.[12]

තාක්ෂලාව පාඩම් මාලා රාශියකින් සමන්විත වූ විශ්වවිද්‍යාලයක් විය. එහි පැවති විද්‍යා පීඨවල ස්වරූපය සළකා බැලීමෙන් උක්ත පාඩම් මාලාවන්හි ස්වරූපය පිළිබඳව අවබෝධයක් ලබාගත හැකි ය.

| | | |
|---|---|---|
| 1 | වෛද්‍ය විද්‍යා පීඨය | -වේදය[13] |
| 2 | අෂ්ටා දශ විද්‍යා පීඨය | -චතුර්වේදය, ගාන්ධර්වය, අර්ථ ශාස්ත්‍රය, ආදී දහඅටක් විද්‍යාවන්[14] |
| 3 | ශිල්ප විඥන විද්‍යා පීඨය | - සිව්සැට කළා ශිල්ප හා විඥන ශාස්ත්‍ර[15] |
| 4 | සෛනික විද්‍යාපීඨය | -සස්ත්‍ර (අතින් පහර දෙන) අස්ත්‍ර (විහිදුවා පහරදෙන) ආයුධ, සරඹ විධි සහ සංග්‍රාම පුහුණුව[16] |
| 5 | ජ්‍යොතිෂ විද්‍යා පීඨය | -ගණිතය, භුගර්භය විද්‍යාව, හස්ත රේඛා, දේහලක්ෂණ විද්‍යා[17] |
| 6 | මන්ත්‍ර විද්‍යා පීඨය | -ඉන්ද්‍රජාල, භූත විද්‍යා, මන්ත්‍ර ශාස්ත්‍ර[18] |
| 7 | පක්ෂි විඥන විද්‍යා පීඨය | -පක්ෂි වර්ග, පක්ෂි ශ්‍රේණි, චිකිත්සා, පක්ෂීන්ගේ හැඬීම්වල අර්ථ[19] |
| 8 | ආයුර්වේද විද්‍යා පීඨය | - රෝග නිධානය, චිකිත්සා ක්‍රම, ඖෂධ හඳුනා ගැනීම, ඖෂධ සංයෝග පිළිබඳව ආයුර්වේද ශාස්ත්‍රය[20] |



වැනි විද්‍යා පීඨ හා විෂය ධාරාවන් ඒ අතර වැදගත් ය. මෙම විෂය ධාරාවන්හි කොටස් ඉගැන්වෙන පාඨමාලා වර්තමාන විශ්වවිද්‍යාල තුළ ඇති නමුත් සමස්ත පාඨමාලාව ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාලයක් සොයා ගැනීම අසීරු ය. සියලුම ක්ෂේත්‍ර පිළිබඳව අවධානය යොමු කර ඇති බව මෙහි දැකිය හැකි විශේෂ ලක්ෂණයකි.

පුරාණ භාරතයේ විසූ සුප්‍රසිද්ධ ජීවක වෛද්‍යවරයා තක්ෂලා විශ්වවිද්‍යාලයේ **ආත්‍රෙය** මහාචාර්‍ය්‍යවරයා යටතේ වෛද්‍ය විද්‍යාව හැදෑරූ අයෙකු ලෙස සැළකේ. ජීවක කළ විශ්මයජනක ශල්‍ය කර්මයක් පිළිබඳව තොරතුරු පූජාවලියේ සඳහන් වේ.[21] **පාණිණී** නම් සුප්‍රසිද්ධ ව්‍යාකරණ ආචාර්‍ය්‍යවරායද, **කෞටිල්‍ය** හෙවත් **චානක්‍ය** නම් ශ්‍රේෂ්ඨ අර්ථ ශාස්ත්‍රඥයා ද, තක්ෂලාවේ ශිෂ්‍යයෝ දෙදෙනෙකි.[22] මේ අනුව බලනවිට මෙම විශ්වවිද්‍යාලයෙහි අධ්‍යාපන පරිපාටිය පෘථුල විෂය මාලාවක් යටතේ පැවති බවත්, එය අධ්‍යාපන විශේෂඥයින්ගෙන් සමන්විත වූ කීර්තිමත් විශ්වවිද්‍යාලයක් බවත් පෙනීයයි. මධ්‍ය ආසියාවේ සිට පැමිණි **ශකමූණ** නම් මොන්ගෝලියන් ජාතිකයින් විසින් තිරුතුරුවම ගන්ධාරය ආක්‍රමණය කිරීමේ හේතුවෙන් සියවස් ගණනාවක් භාරතීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය බවට පත්ව පැවති තක්ෂලාව පරිහානියට පත් විය.

**නාලන්ද විශ්වවිද්‍යාලය**.

නාලන්දවේ ආම්භය සිදු වූයේ විහාරස්ථානයක් වශයෙනි. ක්‍රි.පූ. 3 වැනි සියවසේ වාසය කළ ධර්මාශෝක රජු මෙහි ආරම්භකයා ලෙස සැළකේ. බුදුන් ජීවමාන සමයෙහිම ආරම්භ වූවක් ලෙස ද ඇතැම් තැන්වල සඳහන් වේ.[23] එබැවින් නාලන්දගම බුදුන් වහන්සේ වැඩ සිටි කාලය තරමටම ඉපැරණි ඉතිහාසයක් ඇති ස්ථානයකි. බෞද්ධ සාහිත්‍යයේ සඳහන් "**පාවාරික**" නම් අඹ වනය තිබූ ස්ථානයෙහි වර්තමානයේ **බිහාර්** නමින් හැඳින්වෙන ප්‍රදේශයේ පැට්නා නුවර සිට සැතපුම් සියයකටත් අඩු දුරක නාලන්දව පිහිටා ඇත.

මහා සරිපුත්ත හිමියන්ගේ උපන්ගම ලෙස "**නල**" නමින් හැඳින්වෙන ගමක් රාජගිරිය අසල පිහිටි බවත්, තවත් මතයකට අනුව ඒ ගමම "**නාලක**" "**නාලකග්‍රාම**" නමින් හැඳින්වෙන බව පුරාවිද්‍යාඥයින්ගේ මතයයි. ඒ සමගම මහා වස්තුව නම් සංස්කෘත ග්‍රන්ථයේ සාරිපුත්ත හිමියන්ගේ ජන්ම භූමිය "**නාලන්දක ග්‍රාම**" නමින් හැඳින්වෙන බව ද කියවේ. එබැවින් **නල**, **නාලක**, **නාලන්ද**, **නාලක ග්‍රාම**, යන හැම නමක්ම එකම ස්ථානයකට ව්‍යවහාර කරන්නට ඇතැයි කීර්තිමත් ඉංදියානු පුරාවිද්‍යා නිලධරයෙකු වූ ඒ. **ඝෝෂ්** තුමන් සඳහන් කරයි.

ක්‍රි. ව. 5 සියවසින් පසුව නාලන්දව අධ්‍යාපන ආයතනයක් වශයෙන් ආරම්භ වුවත් කලින් පැවතියේ විහාරස්ථානයක් වශයෙනි. නාලන්ද විහාරයේ ආදි කර්තෘතුමන් අශෝක රජතුමා වුවත්, නාලන්ද විශ්වවිද්‍යාලයයේ ආදි කර්තෘ එතුමා නොවේ. ක්‍රි.ව. 2 ශතවර්ෂය පමණ කාලයේ විසූ ශ්‍රේෂ්ඨ දර්ශනිකයෙකු වූ රසායන ශාස්ත්‍රඥයෙකු වූද, දක්ෂ වෛද්‍යවරයෙකු වූද, **ආචාර්ය නාගාර්ජුන** පාදයන් මෙහි කිසියම් ශාස්ත්‍රීය පර්යේෂණයක සිටි බව ද පසුව නාලන්ද විහාරයේම අධිපති වූ බව ද සඳහන් වේ.

ක්‍රි.ව. 3 සියවසේහි පැමිණි පාහියන් දේශාටක තුමා මේ පිළිබඳව කිසිවක් නොකියන නමුත් ක්‍රි.ව. 7 සියවසෙහි භාරතයට පැමිණි **හියුං සියාං හා ඉට් සිං** මේ පිළිබඳව තොරතුරු සපයයි.

ක්‍රි.ව. (730-740) කාලයෙහි නාලන්දව සුවිශේෂී අධ්‍යාපනික මධ්‍යස්ථානයක් ලෙස පැවතිනැයි **චාල්ස් එලියට්** මහතා පවසයි.[24] නාලන්දව හුදෙක් විහාරස්ථානයක් ලෙස නොපැවතුනි. ආචාර්ය නාගර්ජුන පාදයන්ගේ කාලයේදී ශ්‍රේෂ්ඨ විද්‍යාස්ථානයක් වශයෙන් කීර්තියට පත් වූ බව විශ්වාස කෙරේ. කෙසේ වුවත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මතු කරන ලද නටඹුන් වස්තු අනුව නාලන්ද විශ්වවිද්‍යාලය ගුප්ත රාජ පරම්පරාවට පෙර පැවතුන බවට දැක්වීමට සාධක විරළ ය. සමුද්‍ර ගුප්ත රාජ කාලයේ තඹ සන්නසක් හා කුමාර ගුප්ත රජුගේ කාලයේ කාසියක් ආධාරයෙන් හියුං සියාංගේ වාර්තාවල සමතාවයෙන්ද ඒ මතය පිළිගැනීමට සිදුවේ. ඒ අනුව බැලීමේදී විශ්වවිද්‍යාලයයෙහි ආරම්භය 4 වැනි ශතවර්ෂයේ දී පමණ විය හැක යනුවෙන්ද උපකල්පනය කළ හැකි ය.



ක්‍රි. ව. ආරම්භයේ දී භාරතයේ ඇතිවූ ථෙරවාද බුදු දහමේ පිරිහීමත්, මහායාන බුදු දහමේ නැගීමත්, සමග උසස් අධ්‍යාපන ක්‍රියාවලියෙහි ද සැළකියයුතු වෙනසක් ඇති විය. **නාගාර්ජුන**, **මෛත්‍රීනාථ**, **අසංග**, **වසුබන්ධු**, ආචාර්යවරුන්ගේ ඉගැන්වීම් හේතුවෙන් භාරතය පුරාම මහායානික ඉගැන්වීම් ව්‍යාප්ත විය.[25] ක්‍රි. ව. 5 සියවස පමණ වන විට එම මහායාන ඉගැන්වීම් නාලන්ද මහා විහාරයට ද බල පෑ අතර නාලන්දවේ අධ්‍යාපන කටයුතු කෙරෙහි සෘජු බලපෑමක් ඒ කෙරෙන් සිදු විය [26] ගුප්ත රාජ සමයේ මුල් භාගයේ නැගීගෙන ආ බ්‍රාහ්මණ දහම හා ගැටීමෙන් භාරතයේ බුදු සමය තර්කවාදයට නැඹුරු විය. ක්‍රමයෙන් විශ්වවිද්‍යාලයක් බවට පත්වෙමින් පැවති නාලන්දවෙහි ද මෙය ඉතා ප්‍රකට විය.

ගුප්ත රජවරු නාලන්දවට අලංකාර ගොඩනැගිලි තනවා දීමෙන් හා වෙනත් ආකාරවලින් අනුග්‍රහ දැක්වීමෙන් ද පෙනී යන්නේ එය මෙකළ කීර්තිමත් විශ්වවිද්‍යාලයක් බවට පත්වෙමින් පැවති බවයි.[27] ක්‍රි.ව. 7 සියවසෙහි රජ පැමිණි **හර්ෂ වර්ධන** රජුගේ කාලයේ නාලන්ද විශ්වවිද්‍යාලය පෙරදිග උසස් අධ්‍යාපනයේ මුදුන් මල්කඩ බඳු විය. ඒ පිළිබඳව අතිශය තෘප්තියට පත් රජු මහල් කීපයකින් ද, විද්‍යාල ශාලා අටකින් ද, සංඝාරාමයන්ගෙන්ද යුතු මේ විශ්වවිද්‍යාලයයෙහි නඩත්තුව සඳහා ගම්වර සියයක ආදයම් ද පිරිනමන ලද බව කියවේ.[28]

නාලන්ද විශ්වවිද්‍යාලය පිළිබඳව පුළුල් විස්තරයක් පවසන හියුං සියාං චීන භික්ෂුව තමා එහි පැමිණි අවදියේ ශිෂ්‍ය සංඛ්‍යාව දස දහසක් වූ බවත්, ආචාර්ය මණ්ඩලය එක් දහස් පන්සියයක් පමණ වූ බවත්, සඳහන් කරති. එහි නඩත්තුව රජුන් විසින් සපයන ලද ගම්බිම්වලින් සිදු වූ අතර එබඳු සාරවත් ගම් දෙසීයක් වූ බවත්, ශිෂ්‍යයින්ට නොමිළයේ ආහාර, නිවාස, ලබා දෙන ලද බවත් 7 සියවසෙහි නාලන්දවට පැමිණි ඉට්සිං කියයි. රජ, සිටු ගෘහපතිවරුන්ගේ අනුග්‍රහය නිසාත්, ආචාර්ය මහාචාර්යවරුන්ගේ තියුණු බුද්ධිය නිසාත් විධිමත් පාලනයක් පැවතුනි. මෙහි අධ්‍යාපනය ලත් **ඉට් සිං**, **යවාන්සුවාන්**, වැනි කීර්තිමත් විදේශිය ශිෂ්‍යයෝ සිය ගුරුවරුන්ගේ දැනුම පිළිබඳව පුදුමයට පත් විය.[29]

විශ්වවිද්‍යාලයයෙහි අධිපතිවරයා **කුලපති**" නමින් හැඳින්විනි. හියුං සියාං පැමිණෙන්නට ප්‍රථමයෙන් මෙහි කුලපතිවරයා ලෙස ක්‍රියා කරන ලද්දදේ **ධම්පාල** නමැති හිමි නමකි.

හියුං සියාං පැමිණි කාලයේ ධම්පාල මහා ස්ථවිරයන්ගේ ප්‍රධාන ශිෂ්‍ය **මහාචාර්ය ශීලභද්‍ර** හිමියන් මෙහි "**කුලපති**" ධූරය දැරූහ.[30] උසස් කීර්තියක් දැරූ ශ්‍රේෂ්ඨ පඬිවරුන් කීප දෙනෙකුම නාලන්දවේ කුලපති පදවිය දැරූ අතර නාලන්දව උසස් කීර්තිමත් විශ්වවිද්‍යාලයක් බවට පත්වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ මේ කුලපතිවරුන්ගේ කැපවීමයි. අද ලෝකයේ විශ්වවිද්‍යාලවල පවතින "**උපකුලපති**" ධූරය මෙම කුලපති ධූරයට සමාන විය. නූතන විශ්වවිද්‍යාලවල මෙන් කුලපතිවරයාගේ සහායට කෘත්‍යාධිකාරී මණ්ඩල දෙකක් ද, ක්‍රියාත්මක විය. කිසියම් විද්‍යා ශාලාවක අධිපතිවරයා "**පණ්ඩිත**" යන නමින් හැඳින්විනි. එය වර්තමාන විශ්වවිද්‍යාලයක **පීඨාධිපති** ධූරයට සමානයැයි සැළකිය හැකි ය. **චන්ද්‍රපාල**. **ගුණමතී**. **ස්ථිරමතී**. **ප්‍රභාමිත්‍ර**. **ජිනමිත්‍ර**. **ඥානචන්ද්‍ර සිඝ්‍ර බද්ධ** යන ආචාර්යවරු මෙහි පීඨාධිපතිවරු වූහ.[31]

නාලන්ද විශ්වවිද්‍යාලයයෙහි ඉතා දුර්ලභ ගණයේ පොත්පත්වලින් යුත් පුස්තකාලයක් ද විය. ඉතා උසස් පහසුකම්වලින් යුතුව පැවතියැයි පවසන ඉට්සිං ඔහු සිටි කාලයේ සංස්කෘතික ශ්ලෝක පන්දහසකින් යුත් ග්‍රන්ථ 400ක් එකතු කරගත් බව සඳහන් වේ. එම ග්‍රන්ථ තමන් චීනයට ගෙනගිය බව "**බෞද්ධ ධම් පද්ධති**" නම් සිය කෘතියේ දී සඳහන් කරයි. "**ධම් ගංගා**" නමින් මෙම පුස්තකාලය හැඳින් වූ අතර එහි මහල් කීපයකින් යුතු ගොඩනැගිලි තුනක් විය. **රත්න සාගර**. **රත්නෝදයි**. **රත්න රංජක**. යනුවෙන් ඒවා හැඳින්විණි. ඔවුන් ඉතා ගෞරවයෙන් සළකන ලද ප්‍රඥා පාරමිතා සූත්‍රය, සමාජ ගුහ්‍ය යන තාන්ත්‍රික ග්‍රන්ථ රතනසාගර නම් නව මහල් මන්දිරයේ තිබුණු බව සඳහන් වේ.[32]

නාලන්ද විශ්වවිද්‍යාලයයෙහි අධ්‍යාපන ක්ෂේත්‍රය ඉතා වැදගත් වූවකි. මේ සඳහා සිසුන් ඇතුලත් කිරීම ප්‍රවේශ පරීක්ෂණයක් මගින් සිදු කළ අතර එම ප්‍රවේශ පරීක්ෂණය ගැන



විමසනවිට උසස් අධ්‍යාපනයක් ලබා දී ඇති බව පැහැදිලි ය. සැක නිවාරණය කිරීම, වාද - විවාද මත ඛණ්ඩනයට පුහුණුවක් ලබාදීම, ප්‍රසිද්ධ කතා පැවැත්වීම, වැනි අංශ මෙහිදී විශේෂයෙන් පුහුණු කරන ලදී. නාලන්දවට ඇතුලත්වීම සඳහා විදේශීය - ස්වදේශීය ශිෂ්‍යයින් රැසක් ඉදිරිපත් වුවද, ඉන් සමත් වූයේ සියයට විස්සක් පමණ ඉතා සුළු සංඛ්‍යාවකි. මේ නිසා ප්‍රවේශ පරීක්ෂණය ඉතා ගැඹුරින් පැවැත් වූ බව සිතිය හැකි ය. දර්ශනවාද, තර්ක ශාස්ත්‍ර, නීතිවිද්‍යා, චිකිත්සා වැනි විෂයයන් ගැන අවබෝධයක් ඇති අයට මෙහි ඇතුළුවීම පහසු විය. ප්‍රවේශ පරීක්ෂණයට ඉදිරිපත් වන්නවුන්ගේ දැනීම පරීක්ෂා කිරීමට අධ්‍යාපන පීඨයේ මහාචාර්යවරුන්ගෙන් යුත් පරීක්ෂක මණ්ඩලයක් විය. උසස් අධ්‍යාපනයක් සඳහා පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීමට ඇතුලත්වන්නවුන්ගේ වයස් සීමාව අවුරුදු විස්සකි. එහෙත් ද්විතීයික අධ්‍යාපනයක් ලැබීම සඳහා ඇතුළු වන ශිෂ්‍යයිනට වයස් සීමාවක් නොවීය.[33]

නාලන්දවේ ඉගෙනුම සඳහා පැමිණි ශිෂ්‍යයින් අතර චීනයෙන්, තිබ්බතයෙන් පැමිණි අය පමණක් නොව **ජපන්**. **ජාවා**. **සුමාත්‍රා**. ආදි රටවලින් පැමිණි ශිෂ්‍යයෝ ද වූහ.[34] නාලන්දවේ විශිෂ්ඨ ශිෂ්‍යයින් අතර සුප්‍රසිද්ධ **පාණිනී** ව්‍යාකරණයට ව්‍යාඛ්‍යානයක් ද, වෙනත් ධම් ග්‍රන්ථ හැටක් ද සැපයූ ගුරුළුගෝමී පඬිවරයා, තිබ්බතයේ බෞද්ධ අධ්‍යාපනය පැතිර වූ **මහාචාර්ය ශාන්ත රක්ෂිත** (ක්‍රි.ව.700 - 786) **පද්ම සම්භව** (ක්‍රි.ව. 710- 770) **කමලශීල** (ක්‍රි.ව. 713 - 786) **බුද්ධ කීර්ති** (ක්‍රි.ව. 1084 - 1138) ආදී සුප්‍රසිද්ධ මහ තෙරවරු ද වූහ.

සත්වන සියවස පමණ වනවිට නාලන්දවේ සියලුම ශිෂ්‍යයන් හදළේ මහායාන ග්‍රන්ථයන් ය.[35] හේතු විද්‍යා, ශබ්ද විද්‍යා, චතුර්වේදය, චිකිත්සා විද්‍යා, සර්ප විද්‍යා, සාංඛ්‍ය, යෝග ශාස්ත්‍ර, න්‍යාය, තාන්ත්‍රික මත, ලෞකික විද්‍යා, ලලිත කලා, තාරකා විද්‍යා, සංස්කෘත හා බුද්ධ ධර්මය අනිවාර්යයෙන්ම ඉගැන්වූ විෂයයන් විය. නාලන්දවට පැමිණි හියුං සියාං ද දිගු කලක් නැවතී සිට නීති ශාස්ත්‍රය, පාණිනී ව්‍යාකරණය, විවිධ

දර්ශන හා තර්ක ශාස්ත්‍රය ද උගත් බව සඳහන් වේ.[36] කටපාඩම් කිරීම, අර්ථ ඇසීම, පන්ති ක්‍රමය, කථා පන්ති, පුද්ගලික ක්‍රමය[37] සාමාන්‍ය අධ්‍යාපන මාර්ග විය. විශ්වද්‍යාලයට ඇතුලත්වීමේදී ජාති, ආගම් කුළ, පන්ති, දුප්පත්, පොහොසත්, භේදයක් නොවීය. දක්ෂතා අනුව ශිෂ්‍යයින් ඇතුලත් කරගත් ජාතික විශ්වවිද්‍යාලයක් විය.

අධ්‍යාපනය ලබන කාලය තුලදී පිළිපැදිය යුතු විශේෂ නීති විය. පැවිදි ශිෂ්‍යයින් විසින් ආචාර්ය [38] උපාධ්‍යාය[39] සම්බන්ධය මත බෞද්ධ චාර්‍ය්‍යා ධර්ම පිළිපැදීම සිරිතයි. වාද - විවාදවලින් දිනූ ශිෂ්‍යයින්ට විශේෂ ත්‍යාග ප්‍රදනය කෙරුණි. ඇතැම් ගිහි සිසුනට ඇතෙක් බරට වස්තුව ලැබුණත් භික්ෂූන් පිළිබඳ තත්වය ඊට වඩා වෙනස් විය. විවාදයකින් දිනූ භික්ෂුව සාමාන්‍ය කටයුතුවලින් නිදහස් කරනු ලැබී ය. මෙයට වඩා උගත්කමින් වැඩිගිය අය ඊට වඩා ගෞරව ලැබුණි. පර මත ඛණ්ඩනය සඳහා විශ්වවිද්‍යාලය වෙනුවෙන් වෙනත් ආයතනයකට යැවුනු අතර ඔවුහු **"වාදීන්"** වශයෙන් ගරු සැළකිලි ලැබූහ. මෙහි දිනකට දේශන සියයක් පමණ සංඛ්‍යාවක් පැවැත්විණි. කථිකාචාර්‍යවරු එපමණකට පහසුකම් සළසා තිබුණු බව ඒ අනුව පෙනේ. කුමන හේතුවක් නිසා හෝ නියමිත වේලාව අතපසු නොකළ ඔවුහු නිදගන්නා අවස්ථාව හැරුණු විට අනෙක් සෑම අවස්ථාවකදීම සෑම ශිෂ්‍යයෙකුම අධ්‍යාපන කටයුතුවල නියැලී සිටියහ. වර්තමාන විශ්වවිද්‍යාලවල ගුරු - ශිෂ්‍ය දෙපිරිසටම මෙය කදිම පූර්වාදර්ශයක් බව සටහන් කළ යුතු ය.

නාලන්දවේ පැවති තව විශේෂ ක්‍රමයක් නම් උසස් විද්වතුනට ශාස්ත්‍රිය පර්යේෂණවලට සහභාගිවීමට ඉඩකඩ සැළසීම ය. මේ නිසා විවිධ රටවලින් පැමිණි උගතුනට සිය දැනුම දියුණු කර ගැනීමට අවස්ථාව සැළසුණි.

විශ්වවිද්‍යාලයයේ සංයුතිය ඉතා පුළුල් විය. හියුං සියාං පැමිණෙන විට මෙහි ආචාර්ය ශිෂ්‍ය, සේවක, නේවාසික සංඛ්‍යාව 10000 ක් පමණ වූ අතර ශිෂ්‍ය පිරිස කොටස් තුනකින් යුතු විය.



1. පශ්චාත් උපාධි අපේක්ෂකයින්
2. වයස 20 දී විශ්වවිද්‍යාලයට ඇතුලත් උපාධි අපේක්ෂකයින්
3. වයස 15 දී ද්විතීයික අධ්‍යාපනය ලබන ශිෂ්‍යයින්.

මෙයට අමතරව පශ්චාත් උපාධි සඳහා මොන්ගෝලියාව, ටිබෙට්, චීනය, කොරියාව, ජපානය, සුමාත්‍රා, ජාවා, තුර්කිය, වැනි රටවලින් පැමිණි ශිෂ්‍යයෝ ද වූහ. හීනයාන බෞද්ධ රටවලින් පැමිණි ශිෂ්‍ය පිරිස අඩු වූ අතර පශ්චාත් උපාධි අපේක්ෂකයින්ට පැමිණීම පහසු විය. සාමාන්‍ය ශිෂ්‍යයින්ට ද පැමිණීම අපහසු වුවත් මුළු භාරතය පුරා සෑම ප්‍රදේශයකින්ම ශිෂ්‍යයෝ මේ විශ්වවිද්‍යාලයට ඇතුලත් වූහ.

අධ්‍යාපන ආයතනයේ පාලන කටයුතුවලදී මුළුමනින්ම ප්‍රජාතන්ත්‍රවාදී පිළිවෙතක් අනුගමනය කර ඇත. අධ්‍යාපන කටයුතු සඳහා පැය 08ක් වෙන්කර තිබුණි. වේලාව දැන ගන්නා ලද්දේ පැ තැටියක ආධාරයෙනි. හෝරාවක් සම්පූර්ණවීමේදී බෙරයක් හෝ හක්ගෙඩියක් හෝ නාද කරනු ලැබුණි. දවල් ආහාර ගැනීමට පෙර ස්නානය සඳහා ද කාලයක් වෙන්කර පැවතුණි. ඒ සඳහා අවශ්‍ය නාන තටාක වෙන්ව ඉදිකර තිබූ අතර ස්නානය සඳහා යායුතු වේලාවට සීනුවක් ද නාද කෙරුණි. නාලන්දවේ පාලන කටයුතු සඳහා ශිෂ්‍යයෝද සහභාගි කරවා ගැනීම විශේෂ ලක්ෂණයක් විය. ස්වයංපාලනයක් පැවති එහි ශිෂ්‍යයින්ට නේවාසික පහසුකම් ලබාදීම, වරදකරුවනට දඬුවම් දීම, සිදු කරන ලද්දේ ශිෂ්‍යයන්ගේ ද සහයෝගයෙනි. ශිෂ්‍ය විනය පිළිබඳව ක්‍රියා කිරීම ඔවුන්ටම පැවරීම ද පැවති සුවිශේෂත්වයකි. මසක් පාසා සියලුම ශිෂ්‍යයින් එකතු වී විද්‍යායතනයේ නීති - රීති උල්ලංඝනය නොකිරීමට තීරණය කළ අතර ශිෂ්‍යයින්ගේ වැරදි ක්‍රියාවන් පිළිබඳව පොදුවේ සාකච්ඡා කර නිගමනයකට බසින ලදී. ප්‍රායෝගිකත්වයට නැගිය හැකි මේ ක්‍රමය ඉතාමත් සාර්ථක වූවකි. අවුරුදු ගණනක් යන තුරුම ශිෂ්‍යයිනට දඬුවම් කිරීමට සිදු නොවූ බව ඉට් සිං සිය දේශාටන වාර්තාවේ සඳහන් කරන්නේ එබැවිනි.



UNIVERSITY

නාලන්දවේ දක්ෂ ආචාර්ය මණ්ඩලයක් ද විය. නාගාර්ජුන, ආර්යදේව, රාහුල භද්‍ර, අසංග, වසුබන්ධු, දින්නාග, ගුණමති, ස්ථිරමති, ජයදේව, චන්ද්‍ර කීර්ති, ප්‍රභා මිත්‍ර, චන්ද්‍රගෝමීන්, ජිනමිත්‍ර, ඒ අතර ප්‍රාඥයෝ වූහ. ආචාර්ය මණ්ඩලයට වැඩි වශයෙන්ම ඇතුලත් වූයේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ය.

එක් දහස් පන්සිය හැටකින් ආචාර්ය මණ්ඩලය යුක්ත වූ අතර ඔවුහු කුමන ආකාරයකින් හෝ ශිෂ්‍යයින්ගේ නිදහස් චින්තනයට බාධා නොකළහ. ඒ ඒ සූත්‍ර සංග්‍රහ විස්තර කර දීමට සමත් ආචාර්ය මණ්ඩලයක් නාලන්දවේ සිටි බවත්, එවකට කුලපතිවරයාව සිටි සීලභද්‍ර හිමියනට සූත්‍ර සංග්‍රහ සියල්ල විස්තර කරදීමේ හැකියාවක් පැවති බවත් හියුං සියාං කියයි.[40] මොවුහු ආචාර්යවරුන් ලෙස පමණක් නොව ධර්ම දූතයන් ලෙස විදේශීය රටවලට ගිය බව ද සඳහන් වේ.

එවකට පෙරදිග කීර්තිමත් විශ්වවිද්‍යාලයක් වූ නාලන්දව අද ලෝකයේ කීර්තිමත් ලන්ඩන්, ඔක්ස්ෆඩ්, කේම්බ්‍රිජ්, විශ්වවිද්‍යාලවලට අතිශයින් සමානව තිබෙන්නට ඇත. මේ විද්‍යාස්ථානවල අධ්‍යාපනය ලැබීම ගැන උපාධිධරයින් යම්තරම් ආඩම්බර වන්නේද එසේම ඒ යුගය නාලන්ද ශිෂ්‍යයෙකැයි කියා ගැනීමට හැමෝම කැමති වී ඇත. නාලන්දවේ අධ්‍යාපනය ලැබීමට ඉඩක් නොලද ඇතැම්හු බොරුවටත් තමන් නාලන්ද ශිෂ්‍යයෙකැයි කියාගත් අවස්ථාද තිබූ බව සඳහන් වේ.

නාලන්දවේ ධර්ම ශාස්ත්‍රීය සේවයට අමතරව ප්‍රතිමා වන්දනය, චෛත්‍ය වන්දනය, හා වෙනත් ආගමික පුද පූජා සඳහා ප්‍රායෝගික පුහුණුවක් ලබාදීමට ක්‍රියා කොට ඇත. තාරා, අවලෝකිතේශ්වර[41] මංජුශ්‍රී මෛත්‍රෙය, වජ්‍රායනී, වැනි බෝධිසත්ව වන්දනාද, එහි පැවති බව හියුං සියාං කියයි. බෝධිසත්ව ප්‍රතිමා සුවඳ පැනින් නහවා බාලිකාවන්ගේ භක්තිගීතිකා මැද එවා විහාරයේ තැන්පත් කිරීමක් ගැන ඉට් සිං සඳහන් කරයි. මධ්‍යාහ්නයේ භික්ෂූන් සූත්‍ර සජ්ඣායනා කරමින් චෛත්‍ය ප්‍රදක්ෂිණා කළ බව ද සඳහන් වේ. ප්‍රතිමා වන්දනයේදී බුද්ධ බෝධිසත්ව ප්‍රතිමාවනට විශේෂ තැනක් හිමි විය. දෙවි, දේවතා



ප්‍රතිමා වන්දනය ද ඒ අතර තිබුණි. බ්‍රාහ්මණ ආගම අදහන ශිෂ්‍යයින් සඳහා විෂ්ණු, ශිව, බලරාම, වාසුදේව, ගණේෂ, පාර්වතී, සරස්වතී, වැනි ප්‍රතිමා වන්දනයට ඉඩ සළසා තිබූ බව සඳහන් වේ. හෝම කර්මය ඉගැන් වූ ආචාර්යවරු නාලන්දවේ සිටි බවට සඳහන් වන බැවින් බ්‍රාහ්මණ ආගමික පිළිවෙත් ද තිබෙන්නට ඇතැයි අනුමාන කළ හැකියි.

පුරාවිද්‍යා සාක්ෂි අනුව නාලන්දව පිහිටි භූමි භාගය දිගින් හා පළලින් සැතපුමක් පමණ විය.[42] එහි නිවාස තනවා තිබූ ආකාරය දනුදු දිස්වෙයි. නටඹුන්ව දක්නට ලැබෙන සුවිශාල ගොඩනැගිලි සංකීර්ණය වර්තමාන විශ්වවිද්‍යාලයකට කිසිසේත්ම සමාන කළ නොහැකි ය.

හියුං සියාං නාලන්දව විස්තර කරන්නේ පහත සඳහන් ආකාරයටයි.

විශ්වවිද්‍යාලය සංඝාරාම පහකි. මුළු විශ්වවිද්‍යාලයම උස්වූ ප්‍රාකාරයකින් වට විය. විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වන දොරටුව විවෘත වූයේ මහා දෙසුම් හළකට ය. එහි පසක තවත් දෙසුම්හල් අටක් වී. සංඝාවාස පිහිටියේ මේ දෙසුම්හල් අවට ය. සෑම සංඝාවාසයක්ම මහල් කීපයකින් යුක්ත විය. ප්‍රමාණයෙන් හා උසින් ප්‍රතාපවත් මේ ගොඩනැගිලි මුදුනේ විවිධ කැටයමින් අලංකාර කරන ලද අටළු තවත් ඉහළට නැගින. අටළු මුදුන්වල කඳු සිඛර සේ දිස් වූ කොත් කැරළිය.......... විශ්වවිද්‍යාලයයේ ගොඩනැගිලි අතර උසම මන්දිරයේ උසම ස්ථානයෙහි ආකාස වස්තු පරීක්ෂණාගාරය පිහිටුවා තිබිණ. මෙය වළාකුළුවලට ඉහළින් දිස් විය[43]. හියුං සියාං ප්‍රකාශ කරන මේ සත්‍යය නාලන්දව දසින් දකින්නෙකුට මොනවට පසක් වෙයි. දනට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් මතු කොට දක්වා ඇති විශ්මිත වූ විශ්වවිද්‍යාලයෙහි සුවිශාල ගොඩනැගිලිවල නටඹුන් දුටු විට එය කොතරම් විශ්මය ජනක නිර්මාණයක්ද යන්න අවබෝධ කර ගැනීම අපහසු නොවෙයි. රමණීය භූමි භාගයක පිහිටා ඇති නාලන්දවේ ස්වභාවික පරිසරය වර්තමානයේද අතිශය සිත් ගන්නා සුළු දසුනකි. එහෙත් එහි දිස්වන ගරාවැටුණු සුවිශාල ගඩොල් පර්වත තුළින් පෙනෙන විනාශය ඕනෑම විද්‍යාර්ථයෙකුගේ සිත් කම්පා කරවන්නකි.

12 වන සියවස අග භාගය වන තෙක් උසස් අධ්‍යාපනය පිළිබඳව විශ්ව කීර්තියක් දරූ නාලන්ද විශ්වවිද්‍යාලය මුස්ලිම් ආක්‍රමණික **භක්තියාර් කිල්ජි** නම් කෲර සෙන්පතියා අතින් විනාශයට පත් විය. මුස්ලිම් ඉතිහාස කරුවන් එම නිර්දය පහරදීම සටහන් කරන්නේ පහත සඳහන් පරිදි ය.

"භක්තියාර් කිල්ජි තම අශ්වාරෝහක භට පිරිසක් සමඟ බිහාර නම් බලකොටුවේ දෙරටුව ඉදිරියට ගියේ ය. සතුරා නොදැනුවත්වම බලකොටුව අත්පත් කර ගැනීමට සිතූ භක්තියාර් තම මුළු ශක්තියම යොදා දෙරටුව බිඳගෙන බලකොටුවට ඇතුළු විය............ ජයග්‍රාහකයෝ වස්තුව පැහැර ගත්හ. එහි විසූවෝ හිස මුඩු කළ බ්‍රාහ්මණයෝ ය. ඒ හැම කෙනෙක්ම මරනු ලැබූහ. පසුව එහි තිබී විශාල පොත්පත් තොගයක් සොයා ගන්නා ලදී. පොත් දුටු මුස්ලිම්වරු ඒවායේ අඩංගු දෑ සොයා ගැනීමට පරිවර්තකයෙකු සෙවීය. එහෙත් මේ වනවිට විහාරයේ වැසි සෑම අයෙක්ම මරා අවසන් ය. විහාරය බලකොටුවක් නොව අධ්‍යාපන ආයතයක් බව දැන ගත්තේ එවිට ය.[44]

## වික්‍රමශිලා විශ්වවිද්‍යාලය.

පාල රජ පෙළපතේ දෙවැනියා වූ ධර්මපාල රජු ක්‍රි.ව. (770 - 810) මෙය කර වූ බව සඳහන් වේ. උතුරු මගධ ප්‍රදේශයේ ගංගා නම් ගඟ අසබඩ කඳුගැටයක් මත විශ්වවිද්‍යාලය පිහිට වූ අතර එය විශ්වවිද්‍යාලය නමින් ප්‍රකටවීමට පෙර වික්‍රමශිලා සංඝාරාමය ලෙස ප්‍රසිද්ධියට පත්ව තිබුණි. "**ශිලා සංගම**" යන කෙටි නමින් ද එය හඳුන්වා ඇත. නාලන්ද විශ්වවිද්‍යාලය මෙන්ම රාජකීය අනුග්‍රහය ලද වික්‍රමශිලාව පසු කාලයේදී නාලන්දවද අභිබවා යාමට තරම් සමත් කීර්තිමත් විද්‍යාස්ථානයක් විය.

නාලන්දවේ ඉතා ක්‍රමාණුකූල ප්‍රතාපවත් ගොඩනැගිලි පැවතුනා මෙන්ම වික්‍රමශිලාවේද ඉතා අලංකාර ලෙස නිමවන ලද ගොඩනැගිලි තිබූ බව පුරාවිද්‍යාත්මක පිළි ගැනීමයි. දර්ශනීය ගොඩනැගිලි අතර භික්ෂු නේවාසිකාගාර, දේශන ශාලා, කියවීම් ශාලාද විය. ඒ සියල්ලක්ම මහල් කීපයකින් සමන් විතව පැවතුනි.



එමෙන්ම භූමි භාගයෙහි කුඩා ආවාස ගෙවල් පනස් තුනක් පමණ ද, සංඝාවාස පනස් හතරක් පමණ ද, පැවතුනි. එක් පසක පැවති විහාරයේ මහා බෝධිසත්ව ප්‍රතිමාවක් වීය. මෙම ආයතනයට පිවිසෙන ප්‍රධානතම දෙරටුවේ "**නාගාර්ජුන**", "**අතිශ**" යන පඬිවරුන්ගේ චිත්‍ර ද ඇඳ තිබුණු අතර විද්‍යාපීඨයේ බිත්තිවල ඒ ඒ විෂයයන් ගැන විශ්වකීර්තිය දරා සිටි උගත් පඬිවරුන්ගේ චිත්‍ර ද සිතුවම් කර තිබුණි.[45]

වික්‍රමශිලාවේ ප්‍රවේශ පරීක්ෂණය නාලන්දවේ. පරීක්ෂණයට වඩා තරමක් වෙනස් විය. පරීක්ෂණ මණ්ඩලයක් එහි ද විය. එම මණ්ඩලයේ සාමාජිකයින් "**ද්වාරපණ්ඩිත**" නමින් හඳුන්වා ඇත. උතුර, දකුණ, නැගෙනහිර, බටහිර, ආදී සෑම දෙරටුවකම ද්වාර පණ්ඩිතයින් හය දෙනෙකු විය. ශිෂ්‍යයින්ට මෙම විශ්වවිද්‍යාලයට ඇතුලත් වියහැකිව තිබුනේ මේ අයගේ පරීක්ෂණයකින් අනතුරුව ය.

නාලන්ද විශ්වවිද්‍යාලයයේ මෙන් නොව වික්‍රමශිලාව පිළිබඳව ලබාගත හැකි තොරතුරු ඉතා අල්ප ය. නමුත් එහිද ඉතා උසස් අධ්‍යාපන ක්‍රමයක් තිබෙන්නට ඇත. නාලන්දවේ ථෙරවාද මහායාන බුද්ධ ධර්මය වැඩි වශයෙන්ම ඉගැන්වීම කළ නමුත් මෙම විශ්වවිද්‍යාලයයේ වැඩි වශයෙන්ම දේවධර්මය ඉගැන්වූ බව පෙනේ. තන්ත්‍රයානගරුකයින්ගේ මධ්‍යාස්ථානයක් බවට වික්‍රමශිලාව පත්ව තිබීම මෙයට හේතුවයි. ව්‍යාකරණ, අධ්‍යාත්ම විද්‍යාව, ආයුර්වේදය වැනි විෂයයන්ද නාලන්දවේ මෙන්ම මෙහිද ඉගැන්වී ය. මේ සඳහා වෙන් වූ පීඨ "**වෛඥානික පීඨ**" නමින් හැඳින් වූ අතර පොදුවේ මේ විෂය ධාරාවන් සියලුම ශිෂ්‍යයින් අධ්‍යයනය කළ යුතු විය. පර්යේෂණ කටයුතු සඳහා නාලන්දවේ මෙන් ඉඩ සළසා තිබූ අතරම "**දීපංකර ශ්‍රී ඥාන, අභයාකර ගුප්ත**, මහාචාර්යවරු මෙම විශ්වවිද්‍යාල දෙකේම ඉගැන්වූහ. මේ ආකාරයට ආචාර්ය මණ්ඩල සහයෝගී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම තුළ වික්‍රමශිලාවේද ඉගැන්වීම් කටයුතු උසස් මට්ටමක තිබෙන්නට ඇතැයි සිතිය හැකියි. පුස්තකාල පහසුකම් පිළිබඳව සඳහන් කිරීමේදී නාලන්දවට හා සමාන දුර්ලභ ගණයේ පොත්පත්වලින් යුත් පුස්තකාලයක් ද වීය. ගුරු - ශිෂ්‍ය සම්බන්ධතා හා විනය කටයුතු පිළිබඳ තත්වය නාලන්දවේ මෙන් සිදු කෙරුණි.

නාලන්දවේ පාලන කටයුතුවලට වඩා වික්‍රමශිලාවේ පාලනය ක්‍රමානුකූල විය. ආචාර්‍ය මණ්ඩලය පාලන කටයුතු හා පරිපාලනමය කටයුතු ද මෙහෙය වීය. කුලපතිවරයාට ආචාර්‍ය මණ්ඩලයේ සහාය නිතර ලැබුණි. "**බුද්ධඥාන පාද**" නම් හිමි නමක් එහි ප්‍රථම කුලපති තුමන් වූ බව කියවේ. ශිෂ්‍යයින්ට අවශ්‍ය සෑම පහසුකමක්ම සපයා තිබූ අතර ඔවුන්ගේ නඩත්තුව සඳහා රජ, සිටු, මැතිවරු ගම් බිම් පරිත්‍යාග කර ඇති බව හියුං සියාං වාර්තා කරයි.[46] මේ නිසා නේවාසික පහසුකම් ද ලද ශිෂ්‍යයෝ ආර්ථික අපහසුතාලින් තොරව සිය අධ්‍යාපන කටයුතු කරගෙන ගියහ. නාලන්ද, වික්‍රමශිලා, විශ්වවිද්‍යාල දෙකෙහිම සෑම අංශයක්ම එක හා සමානව තිබෙන්නට ඇතැයි සිතිය හැකි ය. විශ්වවිද්‍යාලයයේ අධ්‍යාපන කටයුතු අවසන් කරන ශිෂ්‍යයින්ට "**පණ්ඩිත**" "**මහාපණ්ඩිත**" යන උපාධි රජු විසින් පිරිනමනු ලැබීය.[47] තුරස්ක ආක්‍රමණයෙන් (ක්‍රි.ව. 1235) වික්‍රමශිලා විශ්වවිද්‍යාලය සම්පූර්ණයෙන්ම විනාශයට පත්විය.

## වලභි විශ්වවිද්‍යාලය.

ක්‍රි.ව. 475 සිට 775 දක්වා මෛත්‍රක රජවරුන්ගේ අගනුවර වූ වලභියෙහි ඒ නමින්ම වූ විශ්වවිද්‍යාලය නාලන්ද, වික්‍රමශිලා විශ්වවිද්‍යාලයන්ට ප්‍රතිවාදීව ථෙරවාදීන් විසින් ආරම්භ කරන ලද්දකි. ශිෂ්‍යයින් 600 කින් පමණ යුක්ත වූ මෙහි විවිධ ප්‍රදේශවලින් පැමිණි ශිෂ්‍යයෝ අධ්‍යයන කටයුතුවල නියැලී සිටියහ. ගුණමතී හා ස්ථිරමතී යන හිමිවරුන් දෙනම එය පාලනය කළ බව කියවේ.[48] මුල්කාලයේ විහාරස්ථානයක් වශයෙන් පැවතුනි.

නමුත් 7 සියවස පමණ වන විට නාලන්දවට හා සමාන ස්ථානයක් වලභියට ලැබුණි. හීනයාන සම්මිතික නිකායට අයත් ශිෂ්‍යයෝ 6000 ක් පමණ නේවාසිකව අධ්‍යයන කටයුතුවල නියැලුනි. ඒ අතර ප්‍රාදේශීය·ශිෂ්‍යයේ ද සිටියහ. විහාර මන්දිර 100 කින් එය යුක්ත වූ බව ද සඳහන් වේ.

විශාල පුස්තකාල පහසුකම්වලින් සමන්විත වූ සරසවියේ විවිධ පාඨමාලා අධ්‍යයනය කළ හැකි විය. සම්මිතික නිකායට අයත් බුදු දහම ප්‍රධානතම විෂය වුවත්, අන්‍ය ආගම් ද



තුලනාත්මකවව උගන්වනු ලැබී ය. එයට අමතරව චතුර්වේදය, බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද්, වැනි හිඳු දර්ශන ද, හිඳු ධර්ම ශාස්ත්‍ර දේශපාලනය, වාණිජ්‍ය, කෘෂි කර්මය, අර්ථ ශාස්ත්‍රය, චිකිත්සා, නීති, වැනි විෂය ධාරාවන් ද පාඨමාලාවට ඇතුලත් විය. මෙහි උපාධිධරයෝ රාජ සභාවල පෙනී සිටීමෙන් තමන්ගේ කුසලතාවයන් ඔප්පු කළ කීර්තිමත් ශිෂ්‍යයින් බවට ප්‍රසිද්ධ ය. මුස්ලිම් ආක්‍රමණ නිසා වලභි සරසවිය ද විනාශයට පත් විය.

## ජගද්දලා විශ්වවිද්‍යාලය

මගධ දේශයේ රජ කළ (ක්‍රි.ව 1084 - 1130) පාලවංශික රාමපාල රජු ජගද්දලා විශ්වවිද්‍යාලය ආරම්භ කරන ලදී. ගංගා නම් ගඟ අසබඩ රාමවතී රාජධානියේ පිහිටු වන ලද්දකි. අනෙක් විශ්වවිද්‍යාල හා සම කළ නොහැකි වුවත් එක්තරා ප්‍රමාණයකට භාරතයට කීර්තියක් ගෙන දුන් අධ්‍යාපන ආයතනයක් බවට ප්‍රකට ය. **විභූතිචන්ද්‍ර**, **දනශීල**, **ශුභාකර**, **මෝක්ෂකර ගුප්ත**, යන මහාචාර්‍යවරු මෙහි සේවය කළහ.

තාන්ත්‍රික බුදු සමය අධ්‍යයනය කිරීම හා ප්‍රචාරය කිරීමේ මධ්‍යස්ථානයක් වූ ජගද්දලාව නාලන්ද විශ්වවිද්‍යාලයයේ අධ්‍යාපන පරිපාටියට සමාන ලෙස සංවිධානය කර තිබුණි. බෞද්ධ, සංස්කෘත ග්‍රන්ථ රාශියක් ටිබෙට් භාෂාවට පරිවර්තනය කරමින් කිර්තියක් දිනා සිටි මේ හිමියන්ගේ කාලයේ හීනයාන මහායාන දෙකම සම සමව අධ්‍යයනය කිරීමට හැකියාව තිබුණි. මුස්ලිම්වරුන්ගේ ආක්‍රමණ හේතුවෙන් පසුකාලීනව විනාශ විය.

## මිථිලා විශ්විද්‍යාලය

දර්ශනික සාකච්ඡාවනට මධ්‍යස්ථානය වූයේ මිථිලාවයි. ජගද්දර නම් මහා පඬිවරයා මිථිලාව කීර්තියට පත් කළ අයෙකි. **මහාත්ම්‍ය**, **මේඝ දූත**, **ගීතගෝවින්ද**, **මාලතී**, **මාධව**, යන ග්‍රන්ථවලට විවරණයන්ද **රසික සර්වසව**, **සංගීත සර්වසව**, යන මූල ග්‍රන්ථයන්ද මොහු අතින් නිම විය. පදවලිය ලියූ විද්‍යාපති මහා කවියාද මිථිලාවේ කීර්තියට පත් පඬිවරයෙකි. වර්ධමාන,

පක්ෂාධර, වැනි තර්ක ශාස්ත්‍රඥයන් යටතේ දෙළොස්වන ශත වර්ෂයේ සිට පසළොස් වන ශත වර්ෂය දක්වා පැවති න්‍යාය පිළිබඳ විද්‍යා පීඨයක් මිථිලාවේ විය. මෙම විද්‍යා පීඨය **ගාංගේෂ** උපාධ්‍යාය විසින් ආරම්භ කරන ලද බව සඳහන් ය. ඔහුගේ පාණ්ඩිත්‍ය **තත්ව චින්තාමණි** නම් ග්‍රන්ථයෙන් මොනවට ඔප්පුවෙයි. එමෙන්ම **වාසුදේව**, **මිශ්‍ර මහේෂ තක්කුරා**, **රඝුනන්ද**, ආදි පඬිවරු මෙහි කීර්තිධරයෝ වූහ. බොහෝ බෞද්ධ පොත් පත් ටිබෙට් භාෂාවට පරිවර්තනය කරන ලද්දේ මෙහි දී ය. ටිබෙට් දේශයේ බුදු දහම ව්‍යාප්ත කළ **ශාක්‍ය ශ්‍රී භද්‍ර** හිමියන් ජගද්දලාවේ ශිෂ්‍යයෙකි.

අවුරුදු 100 ගතවීමටත් පෙර ක්‍රි.ව. 1207 දී මුස්ලිම්වරුන්ගේ ආක්‍රමණ හේතුවෙන් මේ ස්ථානය විනාශ විය.

**ඕදන්තපුරි විශ්වවිද්‍යාලය**

නාලන්දාව ළඟට පැරණිම විශ්වවිද්‍යාලය මෙයයි. මගධයේ පැළලුප් නුවර ආසන්නයේ පිහිටා ඇත. පාල රජවරුන්ගේ කාලයටත් පෙර ආරම්භ වූවායැයි සැළකේ. ක්‍රි.ව. 660 - 705 අතර රජ කළ ගෝපාල රජු මේ ආයතනයේ ආරම්භකයා විය. වික්‍රමශිලාවේ අධිපතිවරයා වූ දීපංකර ශ්‍රී ඥාන පඬිවරයා මහායාන බුදු දහම මේ විද්‍යාස්ථානයෙන් හදරා ඇති බව ප්‍රකට ය.

බෞද්ධ මෙන්ම හින්දු සම්ප්‍රදායන්ට අයත් විශාල පුස්තකාලය පාල රජවරුන්ගේ අනුග්‍රහයෙන් ආරම්භ වූවකි. ඉතාමත්ම ක්‍රමානුකූලව ගොඩනැගිලි නිර්මාණය කර ඇති මෙහි විවිධ ප්‍රදේශවලින් පැමිණි ශිෂ්‍යයෝ අධ්‍යාපනය ලැබූහ. අටවැනි සියවස පමණ වනවිට දියුණුව පැවති සරසවියේ ශිෂ්‍ය සංඛ්‍යාව 12,000 ක් පමණ වූ බව ටිබෙට් වාර්තාවල සඳහන් වේ. නමුත් කුලපති අභයාකර ගුප්ත ගේ කාලය වන විට ශිෂ්‍ය සංඛ්‍යාව දහසක් තරමට අඩුව සිටි බව කියවේ.

ටිබෙට් භාෂාව පිළිබඳව විශාරද දැනුමකින් යුත් **ප්‍රභාකර මති** හිමියන් මෙහි අධිපති වරයා ලෙස ක්‍රියා කළහ.



**නදියා විශ්වවිද්‍යාලය**

ගෞඩ දේශයේ රජ කළ ලක්ෂමණසේන රජුගේ කාලයේ (ක්‍රි.ව. 1106 - 1138) මෙය ප්‍රසිද්ධියට පත් විය. මුස්ලිම් බලපෑම නිසා නව පදනමක් යටතේ අධ්‍යාපන ක්‍රමය ගොඩනැගුණි. විශේෂයෙන්ම හින්දු අධ්‍යාපනය ක්‍රමය මේ තුළ වර්ධනය වූ අතර විවිධ විෂයයන් පිළිබඳ ප්‍රවීණයෝ මෙහි ආචාර්යවරු වූහ.

**ගීතගෝවින්දය ලියූ ජයදේව පඬිවරයා ද**, තර්ක ශාස්ත්‍රය පිළිබඳ මහාචාර්ය **රඝුනාථ ශිරෝමණි**, න්‍යාය පිළිබඳ මහාචාර්ය **වාසුදේව සාර්වභෞම**, ඔවුහු අතුරෙන් කිප දෙනෙකි.

විශේෂයෙන්ම මෙම විශ්වවිද්‍යාලයෙහි මහාචාර්ය පදවියක් පිරිනැමීම කෙනෙකුට කරන ගෞරවයක් ලෙස සැළකී ය. යම් කිසි පුද්ගලයෙකු මහාචාර්ය අපේක්ෂකත්වය දරන්නේ නම් ඔහු ග්‍රන්ථ කර්තෘවරයෙකු, තර්කානුකූලව ඉගැන්වීමට දක්ෂ අයෙකු ද විය යුතු ය. ඊට අමතරව ප්‍රාඥයින් සිටින සභාවකදී විරුද්ධවාදීන්ට මෙල්ල නොවී සිටීමට යම් අපේක්ෂකයෙකුට හැකි නම් ඔහුට ද මහාචාර්ය පදවි පිරිනැමුණි.

අනෙක් විශ්වවිද්‍යාල මෙන් නදියා විශ්වවිද්‍යාලය ද පසුකාලීනව විනාශයට පත් විය.

පෙරදිග අධ්‍යාපන ක්‍රමයෙහි සුවිශේෂී කාර්යභාරයක් මෙන්ම වගකීමක් භාරතීය විශ්වවිද්‍යාල තුළට කේන්ද්‍රගතව පැවති බව මෙම සමාලෝචනයෙන් පෙනී යයි. ලෝකයේ පැරණිතම වූත්, විධිමත් වූත්, ශාස්ත්‍රීය වූත්, උසස් අධ්‍යාපන ආයතන වනුයේ මෙම විශ්වවිද්‍යාලයෝ ය.

වෛදික, බ්‍රාහ්මණ, උපනිෂද් හා හින්දු ධර්මය, ථෙරවාද - මහායාන බුද්ධ ධර්මය, වැනි විවිධ දර්ශන හා මතවාද තුළින් පෙර දිග උසස් අධ්‍යාපනය නිරතුරුවම පෝෂණය කරන ලද බව මේ තුළින් වටහා ගැනීම අසීරු නොවෙයි. මෙහි දී පෙනී යන වැදගත් දෙයක් නම් භාරතයේ ආගම් හා දර්ශනවල ඉතිහාසය, උසස් අධ්‍යාපනයේ දැනුම සෙවීමේ හා දැනුම ලබා ගැනීමේ ඉතිහාසය තරම්ම පැරණි බව ය. වඩාත් ප්‍රායෝගික වූත්,

සන්තානගත මෙන්ම සංස්තාගත වශයෙන් පුද්ගල පෞරුෂය හා ක්‍රියා කෞශල්‍යයන් අර්ථවත් වන අධ්‍යාපන රටාවක් මෙකළ පැවති බව සිතිය හැකි ය.

සත්‍ය ලෙසම නූතන ලෝකයේ කීර්තිමත් විශ්වවිද්‍යාලයයන්ට නොදෙවෙනි අධ්‍යාපන ක්‍රමයක් මේ විද්‍යාස්ථාන තුළ වූ බව සඳහන් කළ යුතු ය. නූතන අධ්‍යාපනඥයින්ට මෙම අධ්‍යාපන ක්‍රියාවලිය වර්තමාන විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ද ක්‍රියාවට නැංවීම සඳහා කාලය එළඹ ඇති බව සිහිපත් කරනුයේ එය පුද්ගල සංවර්ධනයට මෙන්ම සමාජ සංවර්ධනයට ද පිටු බලයක් වන හෙයිනි.

(1996 අප්‍රේල් මස මෙහි දක්වා ඇති ඇතැම් සරසවි පිහිටි ස්ථානවල නටඹුන් අතර ඇවිද සියැසින් දක තොරතුරු රැස්කර ගැනීමෙන් පසු ලියන ලද්දකි.)

**පාදක සටහන්**

1 මෛත්‍රෙයාණි vi 34- 1 හා vi 34-8 හා වෙනත් උපනිෂද් ග්‍රන්ථ

2 රොලින්සන් (1959) භාරතීය සංස්කෘතික ඉතිහාසය රජයේ මුද්‍රණ 56-92 - 63 පිටු.

3 අමර මෝලි හිමි වේරගොඩ, පන්සියපනස් ජාතක පොත (1991) වර්ණ ජාතකය ශ්‍රී ලංකා ප්‍රකාශක සමාගම කොළඹ.

4 එම සුතසෝම ජාතකය.

5 එම සුතසෝම ජාතකය.

6 එම දූත ජාතකය.

7 එම සම්බුලා ජාතකය.

8 එම දුරාජාත ජාතකය හා ජුණ්හ ජාතකය.

9 එම සරභංග ජාතකය.

10 එම චුල්ලසුතසෝම ජාතකය.

11 එම සුතසෝම ජාතකය.

12 එම සීලවීමංස ජාතකය හා තිලමුට්ඨී ජාතකය.



13 එම දුම්මේධ ජාතකය.

14 එම භීමසේන ජාතකය.

15 එම බ්‍රහ්මදත්ත ජාතකය.

16 එම පඤ්චායුධ ජාතකය.

17 එම තුෂ ජාතකය.

18 එම නාමසිද්ධි ජාතකය.

19 එම තුම්මාස පිණ්ඩි ජාතකය හා තිත්තිර ජාතකය.

20 ධම්මානන්ද හිමි. වලානේ (1907) පූජාවලිය ජිනාලංකාර මුද්‍රණ 519 පිටුව හා ප.ප.ජා. පොත කාම ජාතකය 843 පිට

21 ධම්මානන්ද හිමි වලානේ (1907) පූජාවලිය 525 - 526 පිටු.

22 JAYASWAL (1954) Imperial History of India, Motilal Banarsidass, Lahore, p.14,17

23 සීවලි සිරි හිමි, බෞද්ධ ලෝකය බලන්න.

24 එලියට් චාල්ස් ( ) හින්දු සමය හා බුදු සමය II කොටස 140 පිටුව.

25 බුද්ධ දත්ත හිමි, පොල්වත්තේ (1949) භාරතීය බෞද්ධාචාර්යයෝ 13-33-37-40 පිටු.

26 Renchengrabpa bradoon - History of Buddhism p.12

27 බුද්ධ දත්ත හිමි, පොල්වත්තේ (1952) හියුං සියාං භ්‍රමණ වෘතාන්තය, අනුල මුද්‍රණ 273 පිටුව.

28 එම 279 පිටුව.

29 Phanindranath Bose (1923) Indian Teachers of Bddhist University madras p.55.

30 බුද්ධ දත්ත හිමි පොල්වත්තේ (1949) භාරතීය බෞද්ධාචාර්යයෝ 63-68 පිටු..

31 බුද්ධ දත්ත හිමි පොල්වත්තේ (1952) හියුං සියාං භ්‍රමණ වෘතාන්තය 276 පිටුව.

32 Schiefner's Taranath p. 120'

33 බෞද්ධ අධ්‍යාපන දර්ශනය 154 පිට.

34 Hasmukh D Sankaliya (1934) University of Nalanda, Madras p.191

35 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (1952) හියුං සියාං භ්‍රමණ වෘතාන්තය 274, පිටුව.

36 එම 274-275 පිටු.

37 එම 277 පිටුව.

38 ශ්‍රී රේවත හිමි මාවිත්තර (1956) ජිනවචන කෝෂය මහ වග්ග. කොළඹ 1, 64,69,පිටු.

39 එම 705, 707 පිටු.

40 බුද්ධ දත්ත හිමි, පොල්වත්තේ (1952) හියුං සියාං භ්‍රමණ වෘතාන්තය 274, 275 පිටු.

41 Lowenstein tom (1996) the vision of the Buddha. London p.64

42 Majumdar Sastri Surendranath (1924) Cunning ham's Ancient Geography of India, Calcutta P. 537.

43 බලන්න හියුං සියාං භ්‍රමණ වෘතාන්තය.

44 සුමතිපාල කේ.එච්.එම්, පුරාණ ඉංදියාවේ බෞද්ධ විශ්වවිද්‍යාල.

45 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (1952) හියුං සියාං භ්‍රමණ වෘතාන්තය 274 පිටුව.

46. එම 279 පිටුව.

47 Sukumar Dutt (1962) Buddhist monks and monasteries of India, London p.365.

48 බුද්ධ දත්ත හිමි පොල්වත්තේ (1952) හියුං සියාං භ්‍රමණ වෘතාන්තය 334, 335 පිටු..